# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2022.03.15 |

## ශ්‍රී ලංකා ගැණුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2022 පෙබරවාරි

**2022 පෙබරවාරි මාසයේදී ද නිෂ්පාදන සහ සේවා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක තවදුරටත් ඉහළ මට්ටමක පැවතුණි.**

**නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2022 පෙබරවාරි මාසයේ දී 52.5ක අගයක් වාර්තා කරමින් තවදුරටත් ඉහළ මට්ටමක පැවතුණි.** මේ සඳහා ප්‍රධාන වශයෙන් නව ඇණවුම් ඉහළ යාම හේතු විය. එසේ වුව ද, නිෂ්පාදන, තොග මිල දී ගැනුම් සහ සේවා නියුක්තිය පහත වැටුණු අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය පෙර මාසයට සාපේක්ෂව ඉහළ යන ලදී.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**52.5**

**2022 ජනවාරි මාසයට සාපේක්ෂව දර්ශකාංක 6.2ක පහළ යෑමකි**

එළඹෙන සිංහල සහ හින්දු අලුත් අවුරුද්දට සමගාමීව විශේෂයෙන්ම ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයේ නව ඇණවුම් ඉහළ යාමක් 2022 පෙබරවාරි මාසයේ දී නිරීක්ෂණය කරන ලදී. එසේ වුව ද, පෙබරවාරි මාසයේ වැඩ කරන දින ගනන අඩු වීම හේතුවෙන් සෑම වසරකම ඇතිවන බලපෑම මෙන්ම සැපයුම් අංශයේ සීමාවන් හේතුවෙන්, විශේෂයෙන් ආහාර හා පාන වර්ග සහ රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශවල නිෂ්පාදන පෙර මාසයට සාපේක්ෂව අඩු විය. තවද, සැපයුම් අංශයේ බාධාවන් මධ්‍යයේ තොග මිලදී ගැනුම් අඩු විය. ණයවර ලිපි විවෘත කිරීම ප්‍රමාද වීම හේතුවෙන්, ආනයනික අමු ද්‍රව්‍ය සහ ඇසුරුම් ද්‍රව්‍ය ලබා ගැනීමේ දී ඇති වූ අපහසුතාවන් බොහෝ ප්‍රතිචාර දක්වන්නන් විසින් ඉස්මතු කරන ලදී.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචලයය | ජන. | පෙබ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **58.7** | **52.5** | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| **උපදර්ශක** | | | | |
| නව ඇණවුම් | 62.2 | 59.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 59.8 | 45.0 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 55.2 | 46.5 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 55.7 | 47.5 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 56.6 | 63.6 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රට තුළ මෙන්ම ගෝලීය ආර්ථික කටයුතු තව දුරටත් වර්ධනය වීමක් අපේක්ෂා කරමින් ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන අංශයෙහි ක්‍රියාකාරකම් සඳහා වන අපේක්ෂාවන් ඉහළ මට්ටමක පවතී.

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2022 ජනවාරි මාසයට සාපේක්ෂව 2022 පෙබරවාරි මාසයේ දී දර්ශකාංක 0.4කින් ඉහළ යමින් 53.6ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

පෙර මාසයට සාපේක්ෂව 2022 පෙබරවාරි මාසයේ දී එක්සත් ජනපදය, චීනය, ඉන්දියාව සහ එක්සත් රාජධානිය යන රටවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය වැඩි වේගයකින් වර්ධනය විය. එසේ වුව ද, ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පෙර මාසයට සාපේක්ෂව පෙබරවාරි මාසයේ දී සිංගප්පූරුව සහ රුසියාව යන රටවල වැඩි වේගයකින් ද යුරෝපා කලාපයේ අඩු වේගයකින් ද පහළ යන ලදී.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2022 මාර්තු 14 වන දිනට*

*[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයේ සුළු වර්ධනයක් පෙන්නුම් කරමින් සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2022 පෙබරවාරි මාසයේ දී 51.8ක දර්ශක අගයක් වාර්තා කළේය.** මෙම සුළු ඉහළ යෑම සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් යන උප දර්ශකවල ඉහළ යෑම් හේතු විය.

ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා, වෘත්තීය සේවා, දේපළ වෙළඳාම, විදුලි සංදේශ සහ ප්‍රවාහන යන උප අංශවල දක්නට ලැබුණු වර්ධනයන් සමඟ, 2022 ජනවාරි මාසයට සාපේක්ෂව 2022 පෙබරවාරි මාසයේ දී නව ව්‍යාපාර මන්දගාමී වේගයකින් ඉහළ ගියේය.

උප අංශ කිහිපයක දක්නට ලැබුණ වර්ධනයන් සමඟ, ව්‍යාපාර ක්‍රියාකාරකම් අඩු වේගයකින් වුවද, පෙබරවාරි මාසයේදී අඛණ්ඩව වර්ධනය විය. ඒ අනුව, මූල්‍ය සේවා, අධ්‍යාපන, වෘත්තීය සේවා, අනෙකුත් පෞද්ගලික සේවා, දේපළ වෙළඳාම සහ ප්‍රවාහන යන උප අංශවල වර්ධනයන් පෙබරවාරි මාසය තුළ වාර්තා විය. මීට අමතරව, පෙබරවාරි මාසයේ අවසන් කාලයේ දී ඉන්ධන සැපයුමේ අවහිරතා සහ විදුලි බිඳ වැටීම් හේතුවෙන් බාධා ඇති වුවද, සංචාරක පැමිණීම් අඛණ්ඩව වර්ධනය වීම මධ්‍යයේ නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා උප අංශයේ ව්‍යාපාරික ක්‍රියාකාරකම් ද සුළු වර්ධනයක් වාර්තා කළේය. එසේ වුවද, තොග සහ සිල්ලර වෙළඳාම උප අංශයට අදාළ ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල පහළ යෑමක් පෙබරවාරි මාසය තුළ නිරීක්ෂණය විය.

අඛණ්ඩව මස තුනක් ඉහළ යෑම් වාර්තා කළ සේවා නියුක්ති උපදර්ශකය, විශ්‍රාම යෑම් සහ සේවයෙන් ඉවත්ව යෑම් වැඩිවීම හේතුවෙන් පෙබරවාරි මාසයේ දී සුළු වශයෙන් පහත වැටුණි. මේ අතර, පෙබරවාරි මාසයේ දී නිමකිරීමට නියමිත කාර්යයන් ඉහළ වේගයකින් අඛණ්ඩව පහළ ගියේය.

| විචල්‍යය | ජන. | පෙබ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **57.5** | **51.8** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 57.5 | 55.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 62.0 | 56.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 52.0 | 47.0 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 47.4 | 46.3 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 68.5 | 54.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් පෙබරවාරි මාසයේ දී වර්ධනය වුවද, එය ඉතා මන්දගාමී වර්ධනයක් විය. ඒ සඳහා, විනිමය අනුපාතිකය පා කිරීම සහ ආනයන සීමා කිරීම හරහා ඇතිවන පිරිවැය පීඩන සහ සැපයුම් හිඟය හේතුවෙන් තොග සහ සිල්ලර වෙළඳාම උප අංශය ව්‍යාපාර තත්ත්වයේ පිරිහීමක් අපේක්ෂා කිරීම හේතු විය. තවද, ඉන්ධන, විදුලිය සහ එල්. පී. ගෑස් සැපයුම් ආශ්‍රිත අවිනිශ්චිතතාවයන් ද බොහෝ උප අංශවලට අහිතකර ලෙස බලපෑම් ඇති කරයි.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**51.8**

**2022 ජනවාරි මාසයට සාපේක්ෂව දර්ශකාංක 5.7ක පහළ යෑමකි.**

සේවා අංශයෙහි
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි වර්ධනයක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2022 ජනවාරි මාසයේ පැවති 51.0 සිට 2022 පෙබරවාරි මාසයේ දී 53.9ක් වාර්තා කළේය.

ඇමරිකා එක්සත් ජනපදය, චීනය, ඉන්දියාව සහ එක්සත් රාජධානිය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2022 පෙබරවාරි මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, ජපානයේ එය පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2022 මාර්තු 14 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.